# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 829/7 - 1994 ජූලි 26 වැනි අගහරුවාද - 1994.07.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## 1 වන කොටස : (1) වැනි ජේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

භාෂා පරිවර්තක සේවය පිළිබඳ වූ මෙම ව්‍යවස්ථා සංග්‍රහය 1983 ජූනි මස 14 වැනි දින හා අංන 249/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ තරන ලද ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පළ කරනු ලැබේ.

සි. හතරසිංහ,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

1994 ජූලි මස 14 වැනී දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
තැ.පෙ.500,
කොළඹ 01.

01. ක්‍රියාත්මක වීමේ දිනය:- අංක 249/15 හා 1983 ජූනි මස 14 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවය පිළිබඳ වූ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන් යටතේ ගන්නා ලද හෝ එය යටතේ ගත් ලෙස අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි 16 වැනි වගන්තියට යටත්ව මෙම ව්‍යවස්ථා සංග්‍රහය 1992 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වනු ඇත.

2. නිර්වචන

"ව්‍යවස්ථා සංග්‍රහය" භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය
"ලේකම්" රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලබන අමාත්‍යාංශයේ ලේකම්
"සේවය" ඒකාබද්ධ සේවයේ භාෂා පරිවර්තක සේවය

03. ව්‍යුහය හා වැටුප් පරිමාණය :- පහත සඳහන් වාර්ෂික වැටුප් පරිමාණයක් සහිතව 1 වැනි පන්තියට පත් කරනු ලබන හා විශේෂ පංතියට උසස් කරනු ලබන වාර්ෂික ඇස්තමේන්තුවල දක්වා ඇති පරිදි වූ සේවක සංඛ්‍යාවක නිලධාරීන්ගෙන් මෙම සේවය සමන්විත වේ. (මින් ඉදිරියට බඳවා ගැනීම් කරනු ලබන්නේ 1 වැනී පංතියටය. 11 වැනි පංතිය කාලයාගේ ඇවෑමෙන් අහෝසිවනු ඇත.)

විශේෂ පංතිය : රු. 40,800-11 1.200 - රු. 54,000

1 වන කොටස (1) ජේදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය - 1994.07.26

1 වැනි පංතිය : රු. 27000 - 4 x 600 - 10 x 900 - 1x 1,200 - රු. 39, 600
(රු. 28, 800 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමකි.)

11 වැනි පංතිය 1 වැනි ශ්‍රේණිය : රු. 25,200 - 13 x 600 - රු 33,000

111 වැනි පංතිය 11 වැනි ශ්‍රේණිය : රු. 19,680 - 9 x 480 - 8 600 - රු. 28,800

(අ) 1992 ජනවාරි මස 01 වැනි දිනට පැවැති භාෂා පරිවර්තක සේවයේ නිලධාරීන්ගේ උසස්වීමේ බලාපොරොත්තු කෙරෙහි අහිතකර ලෙස බලනොපාන පරිදි වීම හා

(ආ) තරග විභාගයෙන් උසස් කරනු ලබන්නන්ගේ සංඛ්‍යාව එකී විභාගයෙන් සාමාර්ථය ලත් නිලධාරීන්ට පමණක් සීමිත වීම.

යන කොන්දේසිවලට යටත්ව I වැනි හා විශේෂ පන්තියේ සේවක සංඛ්‍යාව අතර ඇති අනුපාතය I වැනි පන්තියේ සෑම හය දෙනෙකු සඳහා විශේෂ පංතියේ එක් අයෙකු වේ.

04. I වැනි පන්තියට පත් කිරීමේ ක්‍රමය :- (අ) I වැනි පංතියේ පුරප්පාඩුවලින් 75% කට නොවැඩි ප්‍රමාණයක් තමා නියම කරන පරිදි තමා වෙනුවෙන් විභාග කොමසාරිස් පවත්වන විවෘත තරග විභාගයක ප්‍රතිඵල අනුව ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂම විසින් පත්වීම කරනු ඇත. (විස්තර “අ“ පරිශිෂ්ඨයෙහි ඇත.)

(ආ) I වැනි පංතියේ පුරප්පාඩුවලින් 25% කට නොවැඩි ප්‍රමාණයක් II වැනි පංතියේ I වැනි ශ්‍රේණියේ අවුරුදු 6 ක් සම්පූර්ණ කළ තමා වෙනුවෙන් විභාග කොමසාරිස් පවත්වන උසස් මට්ටමක යෝග්‍යතා පරීක්ෂණයකින් සමත් වූ නිලධාරීන්ගෙන් රාජ්‍ය පරිපාලන ලේකම්ගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂම විසින් පුරවනු ලැබේ (පැරණි භාෂා පරිවර්තක සේවයේ I වැනි හා II වැනි ශ්‍රේණිවල සේවා කාලයත් මේ සඳහා ගණනු ගනු ලැබේ) (විස්තර “ආ“ පරිශිෂ්ඨයෙහි ඇත.)

(ඇ) යම් අවස්ථාවක පත්කළ යුතු සංඛ්‍යාව ලේකම් වරයා විසින් තීරණය කරනු ඇත.

05. සුදුසුකම්

(I) ශ්‍රී ලංකා පුරවැසියෙක් වන හා

(II) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා සිටින හෝ

(ආ) නීතිඥ විභාගය සමත් වී සිටින හෝ

(ඇ) පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ බහුතාක්ෂණික ආයතනයක වාණිජ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා සිටින හෝ

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කළමණාකරනය පිළිබඳ ජාතික ඩිප්ලෝමා උසස් සහතිකය ලබා සිටින හෝ

(ඉ) මොරටුව විශ්ව විද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය සමග

(III) අ.පො.ස.(සා.පෙළ) හෝ ඊට සමාන විභාගයකදී දෙ වැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් හෝ දෙ වැනි භාෂාව පිළිබඳ පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් සමඟ I වැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා සිටින හා

ඉල්ලුම්පත් පිළිගැනීමේ අවසාන දිනය ඇති මාසයට පූර්වාසන්න වූ මාසයේ අවසාන දිනය වන විට අවුරුදු 21 ට එළඹ ඇති හා අවුරුදු 40 කට එළඹ නොමැති පුද්ගලයෙකුට (රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත වයස් සීමාන බල නොපානු ඇත.) විවෘත තරග විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇත.

සටහන :- සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා විෂයයන්ගෙන් 2 ක් තම උපාධියේ දි සමත් වී ඇති විට එවැනි සුදුසුකම් ලත් අයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය යෝජිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වැටුප් පියවර දෙකක් ඉහළින් තබනු ඇත.

06. වෛද්‍ය පරීක්ෂණය :- තෝරා ගන්නා ලද අපේක්ෂකයා වැඩ භාර ගැනීමට නියමිත දිනට පෙර රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට අපේක්ෂකයා ශාරීරික වශයෙන් සුදුසු යයි සහතික කරනු නොලැබුවහොත් එම පත්වීම ක්‍රියාත්මක නොවනු ඇත.

07. ස්ථිර කිරීම :- විවෘත තරඟ විභාගයකදී ප්‍රතිඵල මත සේවයේ 1 වැනි පංතිය පත් කරනු ලබන නිලධාරියෙකු අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන්නේය. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව ඇති සේවය හා හැසිරීම සතුටුදයක නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දි තනතුරේ ස්ථිර කරනු ඇත.

08. කාර්යක්ෂමතා කඩඉම : 1 වැනි පංතියේ නිලධාරියකු වර්ෂයකට රුපියල් 28,800 වැටුප් තලයට එළඹීමට පළමුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය. වයස අවුරුදු 45 සම්පූර්ණ වූ නිලධාරියෙකු රුපියල් 28,800 ක වැටුප් තලයට එළඹ විට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. (විස්තර “ඉ“ පරිශිෂ්ඨයෙහි දක්වේ)

09. ඉල්ලුම්කිරීමේ ක්‍රමය : ඉල්ලුම්කිරීමේ ක්‍රමය ද ගාස්තු ද ශ්‍රී ලංකා ඉල්ලුම් කිරීමේ ක්‍රමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

10. විශේෂ පන්තියට පත්කිරීමේ ක්‍රමය :- විශේෂ පංතියේ පුරප්පාඩුවලින් 60% කට නොවැඩි සංඛ්‍යාවක් තමා නියම කරන තමා වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් පවත්වන තරඟ විභාගයක ප්‍රතිඵල මත ලේකම් විසින් උසස් කිරීමෙන් පත්වීම් කරනු ඇත. නව 11 වැනි පංතියේ 11 වැනි ශ්‍රේණියේ හැර භාෂා පරිවර්තක සේවයේ වෙනත් ඕනෑම ශ්‍රේණියක ස්ථිර කල වර්ෂ 8 ක සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට විශේෂ පංතියට උසස් කිරීමේ තරඟ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇත. (විස්තර “ඇ“ පරිශිෂ්ඨයෙහි ඇත.)

11. විශේෂ පන්තියේ තනතුරුවලින් 40% කට නොවැඩි සංඛ්‍යාවක් සඳහා 1 වැනි පංතියට හිමි වැටුප් පරිමාණයේ උපරිමයකට පැමිණි නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය මත පත්කිරීම සඳහා ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂමට නිර්දේශ කරනු ඇත.

12. ඉල්ලුම් කිරීමේ ක්‍රමය:- ඉල්ලුම් කිරීමේ ක්‍රමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

13. භාෂා ප්‍රවීනත්වය :- සෑම නිලධාරියෙකුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1v වැනි පරිච්ඡේදයේ විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා කලින් කල පනවනු ලබන අනිකුත් නීති රෙගුලාසි හා ව්‍යවස්ථාවද පිළිපැදිය යුතුය.

14. පත්කිරීම් හා මාරුකිරීම් :- සේවයෙන් නිලධාරීන් ස්ථාන මාරුකිරීමට යටත්වන අතර දිවයිනේකවර කාර්යාලයකට පත්කර/ස්ථාන මාරුකර යැවීමට ඉඩකඩ ඇත. ස්ථාන මාරු කිරීම පහත සඳහන් පරිදි සිදු කෙරේ.

(අ) අමාත්‍යාංශ අතර මාරු කිරීම රාජ්‍ය සේවා කොමිෂමේ ලේකම් විසින්

(ආ) එකම අමාත්‍යාංශය තුල වූ දෙපාර්තමේන්තු අතර, මාරු කිරීම් රාජ්‍ය සේවා කොමිෂමේ ලේකම් වෙත දැනුම් දෙමින් අදාල අමාත්‍යාංශ ලේකම් විසින්

(ඇ) එකම දෙපාර්තමේන්තුව තුල මාරුකිරීම්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂට දැනුම් දෙමින් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කරනු ඇත.

15. සාමාර්ථය ලැබීමේ දිනය :- (අ) විභාග ඉල්ලුම් පත් භාර ගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

16. සේවයේ නියුක්ත නිලධාරීන් ප්‍රතිව්‍යුහගත භාෂා පරිවර්තක සේවයට අන්තර්ග්‍රහණය කිරීම:- රජයේ භාෂා පරිවර්තක සේවයේ නිරතව සිටින භාෂා පරිවර්තකයින් පහත සඳහන් අන්දමින් ප්‍රතිව්‍යුහගත රජයේ භාෂා පරිවර්තක සේවයේ නව පංතිවලට හා ශ්‍රේණිවලට 1992.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්ග්‍රහණය කෙරෙනු ඇත. වැටුප් පරිවර්තනය ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව තීරණය කරනු ඇත.

(අ) 1 වැනි පංතියේ සියළුම නිලධාරීන් යෝජිත විශේෂ පංතියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) පෙර පැවැති උපාධිධාරී නොවන භාෂා පරිවර්තක සේවයේ 1 වැනි ශ්‍රේණියේ සිට දැනට පවත්නා භාෂා පරිවර්තක සේවයේ 11 පංතියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ සහ භාෂා පරිවර්තක සේවයේ වර්ෂ 15 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති (මේ සඳහා පෙර පැවැති උපාධිධාරී නොවන භාෂා පරිවර්තක සේවයේ කිසියම් කාලපරිච්ඡේදයක් ඇතොත් එයද ගණන් ගනු ලැබේ). හෝ
5 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරාලන සියලුම නිලධාරීන් යෝජිත 1 වැනි පංතියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ඇ) 1983 ජූනි මස 14 වැනි දිනට එනම් නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්ම වූ දිනයට පසුව භාෂා පරිවර්තක සේවයට බඳවා ගනු ලැබූ සියලුම උපාධිධාරීන් යෝජිත 1 වැනි පංතියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ඈ) පැවැති සේවයේ 11 වැනි පංතියේ සිටින සෙසු සියලුම නිලධාරීන් යෝජිත 11 වැනි පංතියේ 1 වැනි ශ්‍රේණියට (03 වැනි ඡේදයේ පරිදි අනාගතයේ අහෝසිවීමට නියමිත) අන්තරග්‍රහණය කළ යුතුය.

(ඉ) මෙතෙක් පැවැති සේවයේ 11 වැනි පංතියට අන්තර්ග්‍රහණය කර නැති කලින් තිබූ උපාධිධාරී නොවන භාෂා පරිවර්තක සේවයේ සෙසු සියලුම නිලධාරීන් යෝජිත 11 වැනි පංතියේ 11 වැනි ශ්‍රේණියට 03 ඡේදයේ පරිදි (අනාගතයේ අහෝසිවීමට නියමිත) අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

17. 11 වැනි පංතියේ 11 වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ එම ශ්‍රේණියේ අවුරුදු 06 ක් සම්පූර්ණ කළ නිලධාරීන් නියම කරනු ලබන යෝග්‍යතා පරීක්ෂණයකින් සමත්වීමෙන් පසුව 11 වැනි පංතියේ 1 වැනි ශ්‍රේණියට 03 ඡේදයේ පරිදි (අනාගතයේ අහෝසිවීමට නියමිත) උසස් කරනු ලැබේ.

තමා වෙනුවෙන් විභාග කොමසාරිස් පවත්වන යෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත ලේකම් විසින් පත්වීම් කරනු ඇත. (විස්තර "ඇ" පරිශිෂ්ඨයෙහි ඇත)

18. වැටුප් තල:- භාෂා තුනෙන්ම තුනටම පරිවර්තනය කිරීමේ හැකියාවක් නිලධාරියෙකුට ඇති බවට ලිඛිත පරීක්ෂණයකින් පත් කිරීමේ බලධාරියාට ඔප්පු වූ විට එබඳු නිලධාරියෙකු 1 වැනි හෝ විශේෂ පංතියේ එක් වැටුප් වර්ධකයක් ලබාදෙමින් එම වැටුප් තලය මත පිහිටවනු ලැබේ.

19. විධිවිධාන සළසා නොමැති කරුණු :- මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙන් විධිවිධාන සළසා නොමැති කරුණු පිළිබඳ ලේකම් තීරණය කරනු ඇත.

**“අ“පරිශිෂ්ඨය**

භාෂා පරිවර්තක සේවයේ 1 වැනි පංතියට පත්කිරීම සඳහා පැවැත්වෙන තරඟ විභාගයේ විස්තර (04 “අ“ වැනි ඡේදය )
ලිඛිත විභාගය :- පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්ණ පත්‍ර

(1) පරිවර්තනය - ලකුණු 100 - පැය 3 ක ප්‍රශ්ණ පත්‍රයක්
(2) ඉංග්‍රිසි භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක්
(3) සිංහල භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක්
(4) දෙමළ භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක්
(5) අවබෝධය - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක්

විෂය නිර්දේශය :- (1) පරිවර්තනය :- කාර්යාලීය ලියවිල්ලකින් හෝ වාර්තාවක්හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උධෘතයක් ඇතුළු කාර්යාලීය, විද්‍යාත්මක, නෛතික හා තාක්ෂණික ලියකියවිලි වලින් ද සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවලින් ද උපුටාගත් දුෂ්කර පාඨ කිහිපයක්පහත දැක්වෙන ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(1) සිංහලෙන් දෙමළ බසට සහ දෙමළ බසින් සිංහලට,
(11) සිංහලෙන් ඉංග්‍රිසියට හා ඉංග්‍රිසියෙන් සිංහලට
(111) දෙමළ බසින් ඉංග්‍රිසියට හා ඉංග්‍රිසියෙන් දෙමළ බසට පරිවර්තනයේදී ඉතා උසස් කුශලතාවයක් අපේක්ෂිතය.

ඉංග්‍රිසි/සිංහල/දෙමළ භාෂා ප්‍රශ්ණ පත්‍ර :- මේ සඳහා භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර ඉන් අදාළ භාෂා දෙකක ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් පෙනී සිටිය යුතුය.

(2) ඉංග්‍රිසි භාෂාව :- රචනයෙන් දෙන ලද වචන යොද ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාග් සම්ප්‍රදයක් තේරුම් කිරීම, සංයුක්ත හා සංකිර්ණ වාක්‍ය ඛණ්ඩ වලට විග්‍රහ කිරීම.

(3) සිංහල භාෂාව :- රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ජේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන් ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදයන් තේරුම් කිරීම.

(4) දෙමළ භාෂාව :- රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ජේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වනලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදයන් තේරුම් කිරීම.

(5) අවබෝධය :- සිංහල/දෙමළ/ඉංග්‍රිසි යන භාෂා තුනෙන්ම පිළියෙල කරනු ලබන අවබෝධය ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමැති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවකින් අපේක්ෂකයින්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරාගත යුතු වේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරික්ෂා කිරීමට හැකිවන පරිදිය.

සැ.යු. අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ සුදුසුකම අවලංගු කළ හැක.

පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගෙන උසස් ලකුණු එකතුවක් ලබාගත යුතුය.

## "ආ" පරිශිෂ්ටය

භාෂා පරිවර්තක සේවයේ II වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධාරියකු I වැනි පන්තියට පත්කිරීම සඳහා පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණය - (04(ආ) වැනි ඡේදය)

ලිඛිත පරීක්ෂණය - පරිවර්තනය - එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 100 බැගින් පැය 03 ක ප්‍රශ්න පත්‍ර 2 ක්
විෂය නිර්දේශය - පරිවර්තනය - සරල කාර්යාලවීය ලියවිල්ලකින් හෝ වාර්තාවකින් හෝ පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටා ගන්නා ලද උද්ධෘතයක් පහත දක්වෙන ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(I) සිංහලෙන් දෙමළ බසට සහ දෙමළ බසින් සිංහලට
(II) සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහලට
(III) දෙමළ බසින් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් දෙමළ බසට

(සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.)

## "ඇ" පරිශිෂ්ටය

භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට පත්කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරඟ විභාගයේ විස්තර (10 වැනි ඡේදය)

ලිඛිත විභාගය - පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍ර -

ප්‍රශ්න පත්‍ර 1 - පරිවර්තනය - ලකුණු 100 - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි.
ප්‍රශ්න පත්‍ර 2 - ඉංග්‍රීසි භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි
ප්‍රශ්න පත්‍ර 3 - සිංහල භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි
ප්‍රශ්න පත්‍ර 4 - දෙමළ භාෂාව - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි
ප්‍රශ්න පත්‍ර 5 - අවබෝධය - ලකුණු 150 - විනාඩි 30 ක ප්‍රශ්න පත්‍රයකි.

විෂය නිර්දේශය - (I) පරිවර්තනය - පරිපාලනය, සංවිධානය.ආර්ථික විද්‍යාව, නෛතික හා තාක්ෂණික විෂයයන්ට අදාළ වූ ඡේද පහත සඳහන් ආකාරයට පරිවර්තනය කිරීම කළ යුතු අතර, මෙහි "අ" කොටස වෙනුවෙන් වෙනම ප්‍රශ්න පත්‍රයක් ද "ආ" සහ "ඉ" කොටස් වෙනුවෙන් වෙනම ප්‍රශ්න පත්‍රයක්ද සකස් කරනු ලැබේ.

(අ) සිංහලෙන් දෙමළ බසට හා දෙමළ බසින් සිංහලට හෝ
(ආ) සිංහලෙන් ඉංග්‍රිසියට හා ඉංග්‍රිසියෙන් සිංහලට හෝ
(ඉ) දෙමළෙන් ඉංග්‍රිසියට හා ඉංග්‍රිසියෙන් දෙමළ බසට

ඉංග්‍රිසි / සිංහල / දෙමළ භාෂා ප්‍රශ්න පත්‍ර- මේ සමග භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර ඉන් අදළ භාෂා දෙකක ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් පෙනී සිටිය යුතුය.

(2) ඉංග්‍රිසි භාෂාව - රචනය, සාරාංශය හා වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම
(3) සිංහල භාෂාව - රචනය, සාරාංශය, අක්ෂර වින්‍යාසය හා වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම
(4) දෙමළ භාෂාව - රචනය, සාරාංශය, අක්ෂර වින්‍යාසය හා වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම
(5) අවබෝධය - සිංහල/දෙමළ/ඉංග්‍රිසි යන භාෂා තුනෙන්ම පිළියෙල කරනු ලබන අවබෝධය ප්‍රශ්න පත්‍ර සඳහා තමන් කැමැති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයකුට ඉඩදෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයින්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරාගත යුතු වේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළිවෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකිවන පරිදිය.

සැ.යු. - නරක අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ සුදුසුකම් අවලංගු කළ හැක.

පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40 ක අවම ප්‍රමාණයක් ලබාගත යුතුය.

## <u>"ඇ" පරිශිෂ්ටය</u>

භාෂා පරිවර්තක සේවයේ 11 වැනි පන්තිය 11 වැනි ශ්‍රේණියට අයත් නිලධාරයකු 11 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියට පත්කිරීම සඳහා පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණය (17 වැනි ඡේදය)

ලිඛිත පරීක්ෂණය - පරිවර්තනය - එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 100 බැගින් පැය 3 ක ප්‍රශ්න පත්‍ර දෙකක්

විෂය නිර්දේශය - පරිවර්තනය - සරල කාර්යාලීය ලියවිල්ලකින් හෝ වාර්තාවකින් උපුටා ගන්නා ලද උධෘතයක් පහත දැක්වෙන ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම

(1) සිංහලෙන් දෙමළ බසට හා දෙමළ බසින් සිංහලට
(11) සිංහලෙන් ඉංග්‍රිසියට සහ ඉංග්‍රිසියෙන් සිංහලට
(111) දෙමළ බසින් ඉංග්‍රිසියට සහ ඉංග්‍රිසියෙන් දෙමළ බසට
සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවස වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

## “ඉ“ පරිශිෂ්ටය

## භාෂා පරිවර්තක සේවයෙහි I වැනි පන්තියට පත් කරනු ලබන නිලධාරියකු සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ නිර්දේශ පත්‍රය

## (08 වැනි ජේදය)

ප්‍රශ්න පත්‍ර අංක 1

(i) පොදු වැදගත්කමක් ඇති පාඨයකින්
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් සහ
(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක්

පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම:-

(i) සිංහලෙන් දෙමළ බසට
(ii) සිංහලෙන් ඉංග්‍රිසියට
(iii) දෙමළ බසින් ඉංග්‍රිසියට

ලකුණු 100 - පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

ප්‍රශ්න පත්‍ර අංක 2

(i) පොදු වැදගත්කමක් ඇති පාඨයක්
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් උපුටා ගත් කොටසක් සහ-
(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක්

පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම

(i) දෙමළ බසින් සිංහලට
(ii) ඉංග්‍රිසියෙන් සිංහලට
(iii) ඉංග්‍රිසියෙන් දෙමළ බසට

ලකුණු 100 - පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි. සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය